# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

# අ.පො.ස. (උ. පෙළ) විභාගය - 2021 (2022)

අ.පො.ස. (උ.පෙළ) විභාගය 2022 පෙබරවාරි මස 07 දින ආරම්භ කර 2022 මාර්තු මස 05 වන දින තෙක් පැවැත්වෙන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම විභාගය සඳහා පෙනී සිටින පාසල් අයදුම්කරුවන්ගේ ප්‍රවේශ පත්‍ර හා කාලසටහන් අදාළ පාසල් ප්‍රධානීන් වෙතද, පෞද්ගලික අයදුම්කරුවන්ගේ ප්‍රවේශ පත්‍ර හා කාලසටහන් ඔවුන්ගේ පෞද්ගලික ලිපිනයට ද තැපැල් කර ඇත. පාසල් ප්‍රධානීන් වෙත එවා ඇති පාසල් අයදුම්කරුවන්ගේ ප්‍රවේශපත්‍ර ඔවුන් වෙත නොපමාව බෙදා දියයුතු අතර, කිසිදු හේතුවක් මත ප්‍රමාද නොකළ යුතු බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

මේ වන විටත් ප්‍රවේශ පත්‍ර නොලත් පෞද්ගලික අයදුම්කරුවන් වෙතොත් තමා ඉදිරිපත් කළ ඉල්ලුම්පතේ පිටපතක්, විභාග ගාස්තු ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් හෝ විභාග ගාස්තු ගෙවූ බවට තැපැල් ස්ථානාධිපතිගෙන් ලබාගත් සහතික කළ ලිපියක් පහත සඳහන් ලිපිනයට ලිඛිතව දැන්විය යුතුය. නැතහොත් පැමිණ විමසිය යුතුය. එසේම පෞද්ගලික අයදුම්කරුවන්ට www.doenets.lk දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවියට පිවිස තම ප්‍රවේශ පත්‍රය බාගත කිරීමට අවශ්‍ය පහසුකම් සලසා ඇත.

විදුහල්පතිවරුන් හා පෞද්ගලික අයදුම්කරුවන් වෙත ලැබී ඇති ප්‍රවේශ පත්‍රයන්හි විෂයය සංශෝධන, මාධ්‍යය සංශෝධන හා නාම සංශෝධන සිදුකර ගැනීමට ඇත්නම්.

- **මෙවර සියලුම සංශෝධන මාර්ගගතව සිදුකර ගත යුතු අතර, ඒ සඳහා http://onlineexams.gov.lk/eic වෙබ් අඩවිය වෙත පිවිසිය යුතුය.**
- **එක් අයදුම්කරුවකුට මෙම සංශෝධන සිදුකර ගැනීමට ලැබෙනුයේ එක් අවස්ථාවක් පමණි.**
- **විධිමත් පරීක්ෂණයකින් තහවුරු කරගත් නාම සංශෝධන පමණක් දත්ත පද්ධතියෙහි යාවත්කාලීන කරනු ලබන අතර, තහවුරු නොවන ඉල්ලීම් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**
- **මෙම විභාගයේ විභාග මධ්‍යස්ථාන මාරු කිරීම් සිදුකරනු නොලැබේ.**
- **සංශෝධන සිදු කිරීම 2022.02.01 මධ්‍යම රාත්‍රී 12.00 ට අවසන් වේ.**

අයදුම්කරුවන්ගේ අනන්‍යතාව තහවුරු කිරීම සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය හෝ මෙම විභාගය සඳහා පිළිගත් හැඳුනුම්පතක් වශයෙන් පිළිගනු ලැබේ.

පැය තුනක කාලයක් වෙන් කර ඇති ප්‍රශ්න පත්‍ර සඳහා ප්‍රශ්න පත්‍රය කියවීම හා ප්‍රශ්න තෝරා ගැනීම සඳහා විනාඩි 10 ක අතිරේක කාලයක් ලබාදෙනු ඇත.

1. අයදුම්කරුවකු වෙනුවෙන් වෙනත් අයකු විභාගයට පෙනී සිටීම, සටහන් ළඟ තබාගෙන පිළිතුරු සැපයීම, වෙනත් අයදුම්කරුවකුගේ උදව් ලබාගැනීම, උදව් දීම හා විභාග ශාලාවේ හා ඒ අවට නොමනා හැසිරීම විභාග පනත යටතේ දඬුවම් ලැබිය හැකි වරදකි.
2. මෙම විභාගය සඳහා ගණක යන්ත්‍ර හා මකන දියර පාවිච්චි කිරීමට ඉඩදෙනු නොලැබේ. එහෙත් විෂය අංක 33, 65, 66, 67 සඳහා පමණක් වැඩසටහන් සම්පාදනය කළ නොහැකි සාමාන්‍ය ගණක යන්ත්‍ර භාවිතයට අවසර දෙනු ලැබේ
3. දැනටමත් කිසියම් රජයේ පාසලක ඉගෙනුම ලබන අයකු පෞද්ගලික අයදුම්කරුවකු වශයෙන් විභාගයට පෙනී සිටීම දඬුවම් ලැබිය හැකි වරදක් වන්නේය.
4. විභාග ශාලාව තුළට ජංගම දුරකථන, ස්මාර්ට් වොච් හෝ ඉලෙක්ට්‍රොනික උපාංග ගෙන ඒම සන්තකයේ තබා ගැනීම හා භාවිතය සපුරා තහනම් වන අතර, මෙම නියමය කඩ කරන අය වසර පහක විභාග තහනමකට ලක්විය හැකි අතර, අදාළ උපාංග රාජසන්තක වීමටද ඉඩ ඇත.

**විමසීම් :-**

**දුරකථන අංක : 011-2784208, 2784537**

**ෆැක්ස් අංකය : 011-2784422**

**තැපැල් ලිපිනය : විභාග කොමසාරිස් ජනරාල්, පාසල් විභාග සංවිධාන ශාඛාව, තැ.පෙ. 1503, කොළඹ**

**විභාග කාලසීමාව තුළ පැය 24 පුරාම ක්‍රියාත්මක මෙහෙයුම් මැදිරිය**
**දුරකථන අංක : 0112785211, 0112785212, 0112784208, 0112784537, 0112786616**
**ක්ෂණික ඇමතුම් අංකය : 1911**

**එල්. එම්. ඩී. ධර්මසේන**
**විභාග කොමසාරිස් ජනරාල්**

**6/3/AL/2021**
**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,**
**පැලවත්ත, බත්තරමුල්ල.**
**2022.01.24 දින**